# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

## 2003 අංක 30 දරන තේ පර්යේෂණ මණ්ඩලය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝබර් මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2003 ඔක්තෝබර් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල : රු. 5.50 යි.** **තැපැල් ගාස්තුව : රු. 4.50 යි.**

**2003 අංක 30 දරන තේ පර්යේෂණ මණ්ඩලය (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2003 ඔක්තෝබර් මස 15 වන දින]

එල්. ඩී.–ඕ 16/99.

**1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1**. මේ පනත 2003 අංක 30 දරන තේ පර්යේෂණ මණ්ඩලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

1993 අංක 52 දරන පනතේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**2**. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 5 වන වගන්තිය අවසානයට පහත දැක්වෙන ඡේද එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(ඊ) තේ පර්යේෂණ සඳහා ආයෝජන ප්‍රවර්ධනය කිරීම ;

(උ) තේ කර්මාන්තය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ඒවා බෙදා හැරීමට භාර ගැනීම සහ තේ කර්මාන්තයෙහි සංවර්ධන ශක්‍යතාව නිසැකව දැනගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම ;

(ඌ) තේ කර්මාන්තයට අදාළව උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යවරයාට උපදෙස් දීම සහ අදාළ වෙනත් නියෝජ්‍යායතන සමග සම්බන්ධීකරණය කිරීම. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**3**. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, ඒ වගන්තියේ (1) සහ (2) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(1) මණ්ඩලය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය–

(අ) මණ්ඩලයේ නිල බලයෙන් පත් වූ සාමාජිකයා විය යුතු තත්කාලයේ තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා වශයෙන් ධුරය දරන තැනැත්තා ; සහ

2-H 019149 -4,500 (2003/07)

(ආ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පහත දැක්වෙන නම් කළ සාමාජිකයන් එනම් —

(i) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පනත මගින් පිහිටුවනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් නම් කරනු ලබන ඒ අධිකාරියේ නියෝජිතයකු ;

(ii) (291 වන අධිකාරය වූ) ලංකා වැවිලිකරුවන්ගේ සංගමය ආඥා පනත මගින් පිහිටුවනු ලැබූ ලංකා වැවිලි කරුවන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්) අමතා නම් කරනු ලබන ඒ සංගමයේ නියෝජිතයකු ;

(iii) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(iv) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නියෝජිතයකු ;

(v) කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ දැනුම සහ පර්යේෂණ හා සංවර්ධන පළපුරුද්ද ඇති තැනැත්තන් අතරින් වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

(vi) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නිර්නායක පදනම් කොට තෝරා ගනු ලැබිය යුතු වෘත්තීය සමිති නියෝජනය කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු ;

මේ ඡේදයේ කාර්ය සඳහා "වෘත්තීය සමිති" යන්නට (138 වන අධිකාරය වන) වෘත්තීය සමිති ආඥාපනතේ එයට දී ඇති අර්ථය ම ඇත්තේ ය ;

(vii) කුඩා තේ වතු සංවර්ධන සමිති සම්මේලනය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්) අමතා නම් කරනු ලබන එක් සාමාජිකයකු ; සහ

(viii) පෞද්ගලික තේ කර්මාන්තශාලා අයිතිකරුවන්ගේ සංගමය විසින් ශ්‍රී ලංකා තේ සංගමය (ටී. ඒ. එස්. එල්) අමතා නම් කරනු ලබන එක් සාමාජිකයකු.

(2) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් පත් කළ සාමාජිකයන් අතරින් එක් අයකු පත් කළ යුතු ය. ”.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, ඒ වගන්තියේ (5) වන ඡේදයේ “සාමාජිකයන් පස් දෙනෙක් ”යන වචන වෙනුවට “සාමාජිකයන් හය දෙනෙක්” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, ඒ වගන්තියේ “7 (1) (අ) (1) වගන්තියේ සඳහන් තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ” යන වචන වෙනුවට 7 වන වගන්තියේ 1 වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් තේ පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂවරයා ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, ඔහු” යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

6. මේ පනත ආරම්භවීමට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන්නා වූ මණ්ඩලයේ සමාජිකයන් මේ පනතින් සංශෝධිත පරිදි වූ ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය යටතේ මණ්ඩලය නැවත සංස්ථාපනය කරන තෙක් එලෙස ධුර දැරීම දිගටම කරගෙන යා යුතු ය.

අන්තර්කාලීන විධිවිධාන.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.